**කොළඹ දිසා අධිකරණයේ දී ය.**

කොළඹ 01, ලෝටස් පාරේ, අංක 55, එචලන් චතුරශ්‍රය, කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ, හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ් පිළිබඳව වන කාරණය සම්බන්ධයෙන්

නඩු අංකය :- 217/සීම්

1982 අංක 17 දරණ සමාගම් පනතේ IX වන කොටස යටතේ අධිකරණය විසින් වසා දැමීමට සඳහා වූ ඉල්ලීමක කාරණයේ දී.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක 167/4, විපුලසේන මාවත,
කොළඹ 10.

පෙත්සම්කරු

එදිරිව.

ඈවර කිරීමට යෝජිත සමාගම වන දැන් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී යනුවෙන් හඳුන්වනු ලබන හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්

වර්ෂ 2012ක් වූ මාර්තු මස 15 වන දින දී ය.

මෙම නඩුව 2012.02.16 වන දින මෙම ගරු අධිකරණය ඉදිරියේ අඩ ගැසූ අවස්ථාවේ දී මෙම ගරු අධිකරණයේ ගරු විනිශ්චයකාරතුමන් විසින් මැදිහත්කාර වගඋත්තරකරුගේ ඉල්ලීම ලිඛිතව ඉදිරිපත් කිරීමට 2012.03.15 දින කැඳවීමට නියෝග කරන ලදි. එම නියෝගය ප්‍රකාරව මැදිහත්කාර වගඋත්තරකරු වෙනුවෙන් පහත සඳහන් කරුණු සැලකර සිටී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 2011 අංක 43 දරණ ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනතේ 1 වන උපලේඛනයේ අංක 1 යටතේ හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම නම් කර ඇති අතර, එම සමාගමේ වත්කම් සහ කොටස් එකී පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව මෙම පනත ක්‍රියාත්මක වන 2011.11.11 දින සිට රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු වන්නේ ය.

තවද, එකී පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව කැබිනට් මණ්ඩලය විසින් (කැබිනට් තීරණ අංක 11/2181/504/132-II මත)ඉහත කී හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම

සම්බන්ධයෙන් වූ නිසි බලධාරියා ලෙස ජනාධිපති නීතිඥ සේනක වල්ගම්පාය මහතා පත් කර ඇත.

ඒ අනුව මේ නඩුවේ පෙත්සම්කරු හා අනෙක් පාර්ශවකරුවන්ට අයත් සියලුම කොටස් හා වත්කම් එකී පනතේ 3 වන වගන්තිය ක්‍රියාත්මක වීම තුලින් නිසි බලධරයා වෙත දැනටමත් පැවරී ඇති බව ඉතාමත් ගෞරවයෙන් සැළ කර සිටී.

රජය වෙත මෙම සමාගම පවරා ගනු ලබන්නේ 2011 අංක 43 දරණ පනතේ පූර්ණ ආර්ථික ප්‍රතිලාභයක් ලබා ගැනීමටත් නිසි පරිදි පාලනය, පරිපාලනය, කළමණාකරනය කිරීම හෝ පුනරුදය සිදු කිරීම උදෙසා වන හෙයින් පෙත්සමේ සඳහන් කර ඇති පරිදි මෙම සමාගමට ගෙවිය යුතු ණය පියවීමට නොහැකිය සහ විපයගත සමාගම ගොඩ ගැනීමේ අපේක්ෂාවන් නැතිය නොහැකි අරාජික තරමට බංකොලොත් වී ඇත. යන තත්ත්වය මත නොවන බව ද වැඩිදුරටත් ගෞරවයෙන් සැළ කර සිටී.

මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට හෝ මෙම නඩුවට අදාළ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීමට මෙම ගරු අධිකරණය විසින් නියෝග කලහොත්, 2011 අංක 43 දරණ ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනතේ ප්‍රකාශිතවම සඳහන් වන ප්‍රතිපාදනයන් හා එකී පනතේ පරමාර්ථයන්ට පටහැනිව කටයුතු කිරීමක් වන බවද තවදුරටත් ගෞරවයෙන් සැලකර සිටී.

තවදුරටත් මැදිහත්කාර වගඋත්තරකරු වෙනුවෙන් ගෞරවයෙන් සැළ කර සිටින්නේ,

(අ) 2011 අංක 43 දරණ පනත ක්‍රියාත්මක වීම මත පෙත්සම්කරු තවදුරටත් කොටස් හිමියෙකු නොවන බවත්,

(ආ) මෙම නඩුව මෙම අධිකරණය ඉදිරියේ පවත්වාගෙන යාමට පෙත්සම්කරුට නෛතික පදනමක් නොමැති බවත්,

(ඇ) පෙත්සම්කරුගේ නඩුව මෙම කරුණු මතම නිශ්ප්‍රභා විය යුතු බවත් ය.

ඇවර කිරීමට යෝජිත සමාගම වන දැන්
හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී
යනුවෙන් හඳුන්වනු ලබන හොටෙල්
ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි නීතිඥ.

ඇ/217-CO- 2 doc-Z

<u>කොළඹ දිසා අධිකරණයේ දී ය.</u>

කොළඹ 01, ලෝටස් පාරේ, අංක 55, එචලන් චතුරශ්‍රය, කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ, හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ් පිළිබඳව වන කාරණය සම්බන්ධයෙන්

නඩු අංකය :- 217/සිඹි

1982 අංක 17 දරණ සමාගම් පනතේ IX වන කොටස යටතේ අධිකරණය විසින් එසා දැම්මට සඳහා වූ ඉල්ලීමක කාරණයේ දී.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක 167/4, විපුලසේන මාවත,
කොළඹ 10.

පෙත්සම්කරු

වර්ෂ 2012ක් වූ මාර්තු මස 15 වන දින දී ය.

මෙම නඩුව 2012.02.16 වන දින මෙම ගරු අධිකරණය ඉදිරියේ අඩ ගැසූ අවස්ථාවේ දී මෙම ගරු අධිකරණයේ ගරු විනිශ්චයකාරතුමන් විසින් මැදිහත්කාර වගඋත්තරකරුගේ ඉල්ලීම ලිඛිතව ඉදිරිපත් කිරීමට 2012.03.15 දින කැඳවීමට නියෝග කරන ලදි. එම නියෝගය ප්‍රකාරව මැදිහත්කාර වගඋත්තරකරු වෙනුවෙන් පහත සඳහන් කරුණු සැලකර සිටී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 2011 අංක 43 දරණ ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුද්ධය කිරීමේ පනතේ 1 වන උපලේඛනයේ අංක 1 යටතේ හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම නම් කර ඇති අතර, එම සමාගමේ වත්කම් සහ කොටස් එකී පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව මෙම පනත ක්‍රියාත්මක වන 2011.11.11 දින සිට රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු වන්නේ ය.

තවද, එකී පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව කැබිනට් මණ්ඩලය විසින් (කැබිනට් තීරණ අංක 11/2181/504/132-II මත)ඉහත කී හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම සම්බන්ධයෙන් වූ නිසි බලධාරියා ලෙස ජනාධිපති නීතිඥ සේනක වල්ගම්පාය මහතා පත් කර ඇත.

ඒ අනුව මේ නඩුවේ පෙත්සම්කරු හා අනෙක් පාර්ශවකරුවන්ට අයත් සියලුම කොටස් හා වත්කම් එකී පනතේ 3 වන වගන්තිය ක්‍රියාත්මක වීම තුළින් නිසි බලධරයා වෙත දැනටමත් පැවරී ඇති බව ඉතාමත් ගෞරවයෙන් සැළ කර සිටී.

රජය වෙත මෙම සමාගම පවරා ගනු ලබන්නේ 2011 අංක 43 දරණ පනතේ පූර්ණ ආර්ථික ප්‍රතිලාභයක් ලබා ගැනීමටත් නිසි පරිදි පාලනය, පරිපාලනය, කළමණාකරනය කිරීම හෝ පුනරුදය සිදු කිරීම උදෙසා වන හෙයින් පෙත්සමේ සඳහන් කර ඇති පරිදි මෙම සමාගමට ගෙවිය යුතු ණය පියවීමට නොහැකිය සහ විපයගත සමාගම ගොඩ ගැනීමේ අපේක්ෂාවන් තැබිය නොහැකි අරාජික තරමට බංකොලොත් වී ඇත. යන තත්ත්වය මතු නොවන බව ද වැඩිදුරටත් ගෞරවයෙන් සැළ කර සිටී.

මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට හෝ මෙම නඩුවට අදාල හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම ගණින් බේරා වසා දැමීමට මෙම ගරු අධිකරණය විසින් නියෝග කලහොත්, 2011 අංක 43 දරණ ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනතේ ප්‍රකාශිතවම සඳහන් වන ප්‍රතිපාදනයන් හා එකී පනතේ පරමාර්ථයන්ට පටහැනිව කටයුතු කිරීමක් වන බවද තවදුරටත් ගෞරවයෙන් සැළකර සිටී.

තවදුරටත් මැදිහත්කාර වගඋත්තරකරු වෙනුවෙන් ගෞරවයෙන් සැළ කර සිටින්නේ,

(අ) 2011 අංක 43 දරණ පනත ක්‍රියාත්මක වීම මත පෙත්සම්කරු තවදුරටත් කොටස් හිමියෙකු නොවන බවත්,

(ආ) මෙම නඩුව මෙම අධිකරණය ඉදිරියේ පවත්වාගෙන යාමට පෙත්සම්කරුට නෛතික පදනමක් නොමැති බවත්,

(ඇ) පෙත්සම්කරුගේ නඩුව මෙම කරුණු මතම නිශ්ප්‍රභා විය යුතු බවත් ය.

මැදිහත්කාර ~~වග~~උත්තරකරුගේ නීතිඥ.

අ/217-CO doc-Z